"හලෝ…" එහා කෙළවරේ සිට ඔහු මා ඇමතුවේ හඳුනා නොගෙනය.

"මහේල… මට උඹව හම්බවෙන්න ඕනෑ මේ දැන්… කියපන් කොහේට ද එන්න ඕනෑ කියල…" ඔහු මගේ කටහඬ ද, මගේ කෝපය ද දෙකම එකවර හඳුනාගන්නට ඇත.

"ලහිරු. මම දන්නව උඹ කලබල වෙලා තියෙන්නෙ ඇයි කියල? මගේ වෙඩින් කාඩ් එකේ ටාන්‍යාගේ නම නැති නිසානෙ…"

"ඔව්. ඒක නිසා තමයි.. උඹ මහ පහත් මිනිහෙක් මහේල…."

"ඒක මගේ වරදක් නෙමෙයි…"



"උඹේ වරදක් නෙමෙයි. එහෙනම් කාගෙ ද?"

"ඒක අහපන් ටාන්‍යාගෙන්…"

මා නිහඬ වුණෙමි. මහේල මේ කියන්න යන්නේ කුමක් ද?

"ලහිරු උඹ හැමදාම මාව තේරුම් ගත්තෙ වැරැදියටයි. මේ කාරණේ දී මගේ වරදක් නැහැ මචං…."

"උඹේ බණ නවත්වල, කියපන් ටාන්‍යාගෙන් අහගන්න ඕනෑ මොකද්ද කියල…" මගේ තරහ ඒ වන විට මඳකට සිඳී තිබිණි.

"ටාන්‍යාටයි ඕනෑ වුණේ මේක නවත්තන්න…"

"මට නම් ඒක විශ්වාස කරන්න බැහැ මහේල… ටාන්‍යා ඒ ජාතියෙ කෙල්ලක් නෙමෙයි කියල මම හොඳට ම දන්නව…"

"උඹ කියන දේ ඇත්ත තමයි… ටාන්‍යා එච්චර කැමැත්තකින් නෙමෙයි මේක නතර කළේ…"

"මොන බම්බුවක් ද බං උඹ ඔය කියන්නෙ?… මගේ ප්‍රශ්නෙ උඹ, දන්නව. මට ඒකට කෙලින් උත්තරයක් දීපං."

"ටාන්‍යට එයාගෙ ගෙදරින් ආව බලපෑමටයි මේ සම්බන්ධෙ නතර කරන්න තීරණය කළේ… මටත් වෙන කරන්න දෙයක් නැහැ ලහිරු… අපේ ගෙදරිනුත් මට බලකරනව කසාදයක් කරගන්න කියල…" මහේල කියන්නේ ඇත්තක් නොවේ යැයි මට කිව නොහැක. කිසිවක් හරිහැටි මා දන්නේ නැත. එදා තේ වත්ත මැද්දේදී ඇගේ පවුලේ තත්වය ගැන ටාන්‍යා මා සමග කී කතාව මට සිහිවිය.

"ලහිරු මට පස්සෙ දවසක හම්බවෙලා උඹට විස්තර කියන්නම් ඔක්කොම… මමත් ඉන්නෙ හරිම හිතේ අමාරුවකින්.. මට කොහෙත්ම ඕනෑ කළේ නැහැ ලහිරු මේ සම්බන්ධය නවත්වන්න… ටාන්‍යාට මම ආදරය කළේ කැත හිතකින් නෙමෙයි… මාව තේරුම් ගනිං මචං…" මහේල බොහෝ දේ කතා කළේය. මට ඒ කිසිවක් ඇසුනේ නැත. මා සිටියේ ටාන්‍යා ගැන සිහියෙනි.

"මම දැන් තියනව මහේල…"

"මචං නොවරදවාම මගෙ වෙඩින් එකට උඹ එන්න ඕනෑ…"

මා දුරකථනය නවත්වන්නට ප්‍රථම ඔහු කියනවා ඇසිනි. එය ආපසු තැබූ පසු මට සිහි වුයේ මේ විවාහය ගැන ටාන්‍යා දන්නවා ද නැත්ද යන්න පිළිබඳව කිසිවක් ඔහු නොකී බවයි. එහේත ටාන්‍යාම මෙය නවතා දැමුවා නම් ඇට මහේලගේ විවාහය ගැන දැන ගැනීමෙන් කවර ඵලක් ද?

මා ඒ සතියම ගතකර දැමුමේ සිතිවිල්ලෙනි. හැම මොහොතකම මට සිතුනේ ටාන්‍යාගේ මානසික තත්වය කුමක් ද යන්නය. මේ ඇයට හිතවතෙකුගේ පිහිට අවශ්‍යම මොහොතකි. නමුත් ඈ සිටින්නේ සැතපුම් දහස් ගණනක් දුරිනි. මේ ඇසුර නතරකර දමා දැන් කොයිතරම් කාලයක් ගෙවී ගොස් ඇත්ද? මට නැවත මහේලගෙන් තොරතුරු විමසීමට සිත් නොදේ… කෙසේ වුව ද මම මහේලගේ මඟුලට යනවා යැයි තීරණය කෙරුවෙමි.

ඒ මංගල උත්සවය පුරා මා සිත චකිතයට පත්කළ සිදුවීම් බොහෝ විය. විශේෂයෙන් ම පර්ත් සිට පැමිණි, මා කලින් හඳුනාගෙන නොසිටි සමහර තරුණයන් කතාබහ කළ කරුණු ටාන්‍යා පිළිබඳ වීම මා වඩාත් ම මහේලව සැක කිරීමට පෙළඹවන ලදී.

"මහේල මේ අල්ලගෙන ඉන්නෙ බර අත්තක්…"

"මට තේරෙනව
පුතාගෙ හිත ගැන.
ඒත් තාත්තගෙන් නාහ
මට කිසිම තීරණයක්
දෙන්න බැහැ පුතා ඔයාට..
තාත්තත් මමත්
පුතා වෙනුවෙන්
මොකක් කරන්න ඕනෑ කියල ද
ඔයා බලාපොරොත්තු වෙන්නෙ…"

ඌ කවදත් අනුන් ලවා බර ඇද්ද එකෙක්නෙ…"

"ඒක ඇත්ත… පර්ත් ඉන්නකම් ටාන්‍යා" ඔවුන් සිනාසෙමින් ටාන්‍යා ගැන කරන ලද කතාව මා අසා සිටියේ හදවත පුරෝගත් දුකකිනි.

"ඌ හැබැයි ටාන්‍යාව ආශ්‍රය කළේ සීරියස්ලි නෙමෙයි… සල්ලි නම් යහමින් වියදම් කරෝ ගත්ත…"

"කෙල්ල ගානෙ ලංකාවෙ ටුවර් එකකුත් ඇවිත් ගියා ඒ කාලෙ…"

"මටත් මතකයි, ඒ වුණාට මහේලට ඒ කාලෙම කෙල්ලව එපා වෙලා හිටියෙ… ඒකි ෆුල් සීරියස් කියල.."

"පව් බං ඒ කෙල්ල…"

"ඔය සුදු කෙල්ලන්ට ඕවයෙ ගාණක් නැහැ බං…"

ඒ කතා තව දුරටත් අසාසිටිය නොහැකියැයි සිතුනෙන් මම එතනින් ඉවත් වුණෙමි. මහේල මට කියුවේ බොරුවක් යැයි මට දැන් හොඳට ම පැහැදිලි ය. මට ටාන්‍යා කෙරෙහි ඇතිවන්නේ කිව නොහැකි තරමේ දුකකි. විශේෂයෙන් මේ නොදන්නා තරුණයන් අතර ඈ සෙල්ලම් බඩුවක මට්ටමට වැටී තැබීම මට ඉහිලුම් නොදෙන්නකි. මේ බිමේ මා හැර ටාන්‍යාව හරි හැටි තේරුම් ගත හැකි වෙනත් කිසිවෙකුත් නැති බව මම දනිමි.

"හොඳයි මහේල… අපි බලාගනිමුකෝ ඒක වෙලාව ආවහම…." යැයි සිතාගනිමින් මම එතනින් ඉවත් වීමි. මේ මහේල වෙනුවෙන් සිතිවිලි මිඩංගු කළ යුතු කාලයක් නොවේ. මා සොයා බැලිය යුත්තේ ටාන්‍යා ගැන ය. එදා සෙනසුරාදා දවසකි. මම ඒ අඳුම පිටින් ම ගෙදර ගියෙමි. මේ මොහොතේ මට උදව්වක් ලබාගත හැකි එකම කෙනා අම්මා බව සිත කියයි. මා යන විට තාත්තා ගෙදර සිටියේ නැත. ඔහුගේ වැඩට සෙනසුරාදා කියා වෙනසක් නැත. මා පැමිණ ඇති ගමනේ විශේෂත්වයක් ඇත යැයි අම්මාට හැඟී යන්නට ඇත. එහෙත් කිසිවක් ඈ ප්‍රශ්න කළේ නැත.

මම පැයක් පමණ වෙලාවක් නෑමට ගත කළෙමි. ඒ අතර ඉදිරියට කළ යුතු සියල්ල සැලසුම් කර ගතිමි. කුස්සියේ තේ බොන අතරම මම අම්මාට මහේලගේත් ටාන්‍යාගේත් තත්වය විස්තර කෙරුවෙමි. ඈ සියල්ල නිහඬව අසා සිටියාය. ඉන්පසුව ඈ ප්‍රශ්න කරන ලද්දේ මා ගැනය.

"පුතා, දැන් මොනව ද ඒ ගැන කරන්න බලාපොරොත්තු වෙන්නෙ…."

"අම්මා මට සැක හිතෙනව මහේල කියන්නෙ බොරු කියල. මට දැනගන්න ඕනෑ ටාන්‍යගෙ පැත්තෙන් ඇත්ත තත්වෙ මොකක්ද කියල…"

"හොඳයි. ටාන්‍යා මේ මොනවත් ගැන දන්නෙ නැත්නම් ඒ කියන්නෙ මහේල පුතාට කිව්වෙ බොරුවක් නම් පුතා මොකද කරන්නෙ…"

"මම හිතනව මම ටාන්‍යාට උදව් වෙන්න ඕනෑ කියල අම්මා…." අම්මා මා තේරුම් ගන්නවා ඇත යැයි මම සිතන්නෙමි. ඈ කවදත් අඩු වචන ප්‍රමාණයකින් යමක් තේරුම් බේරුම් කරගත් තැනැත්තියකි.

"ටාන්‍යා ඉන්නෙ පුතා අපිට භූගක් දුරින්…. මෙහ ඉඳල පුතාට පුළුවන් ද එයාට උදව්වක් වෙන්න…"

"මම එහෙම නම් එහෙ යනව අම්ම…" මා එසේ කළ යුතු යැයි මම සිතා සිටියෙමි. ඒ හදවතට පිහිටක් වීම වෙනුවෙන් මට යා යුතුව ඇති දුර ප්‍රශ්නයක් නොවන්නේ ය.

"අම්ම ප්ලීස්… මේ වෙලාවෙ මා ගැන වරදවා හිතන්න එපා… යාළුවෙක් හැටියට මේ වෙලාවෙ ටාන්‍යාට උදව් කරන්න ඕනෑ මම…"

"මට තේරෙනව පුතාගෙ හිත ගැන. ඒත් තාත්තගෙන් නාහ මට කිසිම තීරණයක් දෙන්න බැහැ පුතා ඔයාට.. තාත්තත් මමත් පුතා වෙනුවෙන් මොකක් කරන්න ඕනෑ කියල ද ඔයා බලාපොරොත්තු වෙන්නෙ…"

"තාත්ත නෙමෙයි අම්ම… අම්මටයි මේක දැනගන්න පුළුවන්…. අම්මට පුළුවන් නේද ටාන්‍යාට කතා කරන්න… කතා කරල දැනගන්න එයාගෙ හිතේ මහේල ගැන බලාපොරොත්තුවක් තවමත් තියනව ද කියල…"

ඇගේ මුහුණේ ඇත්තේ බැරෑරුම් පෙනුමකි. ඇය බෑ කියයි ද කතා කරන්න?

"පුතා ඒ ගැන නම් ඔයාට දැනගන්න ඕනෙ…" ඇය නැවතත් සිතිවිල්ලට වැටුනි. බලාපොරොත්තු සහිතව බලාසිටිනවා හැරුනු විට වෙනත් කල හැකි යමක් මා වෙත නොවිය. නමුත් තාත්තා පැමිණීමට ප්‍රථම මේ කරුණ පැහැදිලි කරගත යුතුය. ඔහු ඉදිරිපිටදී මෙවැන්නක් කතාකිරීමට තරම් ශක්තියක් මා වෙත නොමැත. එහෙත් අම්මා කතා කලේ මම බලාපොරොත්තු නොවූවකි.

"ඔයා අහන් නැතිව ඔයාට මේ දේවල් කියන්න පුළුවන්කමක් අපිට තිබුණෙ නැහැ ලහිරු…"

"අම්ම මොනව ගැන ද මේ කියන්නෙ…?"

"ටාන්‍ය ගැන…"

මම පුදුම වුණෙමි.

**ලබන කලාපයට**




ජන ගෞරවයට පාත්‍රවූ බොහෝ නායකයන් සිරබත් කෑ උදවියයි සිරදඬුවම වරප්‍රසාදයක් කරගෙන ජන සේවයට කැපවන්න

*නුවරගම් පළාතේ සගනාහිමියෝ එස්.බී ට කියති*

*ලංකාදීප*

**එහෙමයි ස්වාමීන්වහන්සෙ… මිහිහෙක් දෙන්නෙකුත් මැරුවා නම් සුදුසුකම තවත් සම්පූර්ණ වෙනවා**

ශ්‍රීලනිපය වෙනුවෙන් මා කළ කැපවීම පක්ෂයේ ඇතැම් නායකයන්ට අමතකයි

*චන්ද්‍රිකා කියයි*

*ලංකාදීප*

**ඒ කැපවීම රට වෙනුවෙනුත් දැක්වුවා නම් නොයි තරම් අගෙයිද….?**

යුක්ති ගරුක හා විනය ගරුක සමාජයක් බිහිකිරීමට රන්ජන් විජේරත්න කැපවුණා

*15 වැනි ගුණ සමරු උළෙලේදී එජාප නියෝජ්‍ය නායක කරු ජයසූරිය කියයි*

*ලංකාදීප*

**කියලා වැඩක් නෑ…. අපටත් මතකයි …. යුක්ති ගරුක හා විනය ගරුක සමාජය හදන්න කොච්චර නම් ටයර් පුච්චන්න වුණාද උන්නැහේට…….. ඒවා උඩට වැටිලා කොල්ලෙක් දෙන්නෙක් මැරුණ එක වෙනම කතාවක් නේද?**

ජනතාව සමග වැඩ කරන නිලධාරීන් කෙළින් වැඩ කළ යුතුයි

*ලක්බිම*

**ජනතාව ඉදිරියේ කෙළින් සිට දේසපාලකයන් ඉදිරියේ දෙකට නැවිය යුතුයි**

මිනීමැරුම්, කොල්ලකෑම්, මත්කුඩු ජාවාරම්, අල්ලස් වැනි අපරාධ රැසක සැකකරුවෝත් මෙවර පුංචි ඡන්දයට ඉල්ලති

*දිවයින*

**ඒ වගේ හාදයෝ මහ ඡන්දෙටත් ඇවිත් පාර්ලිමේන්තුත් යන රටේ ඕකත් වැඩක් ද?**